

වනිතාවන් වෙනුවෙන් විමලා සකලසූරිය මහත්මිය විසින් ගොවිකම් සඟරාවට මෙම ලිපි විශේෂයෙන් සකසන ලදී.

# ළදරුවකුට ඇඳුමක්


ළදරුවකුට කොතෙකුත් හැඩ වැඩ දමා මෝස්තර කිරීමට යාමෙන් ඇඳුම් ගැන ඔහුගේ තද අප්‍රසන්නතාවයක් ඇති වන්නේ, ඒවා ඇන්දවීමේදී සහ මාරු කිරීමේදී ඇති වන අපහසුව නිසායි. අනවශ්‍ය පරිදි මැහුම් රාශියක් යොදා තද ඇඳුම් ඇන්ද වීමෙන් ශරීර සනීපයට හා ළදරුවාගේ වැඩීමට ද, බාධා පැමිණේ.

පහතින් පෙන්වා ඇත්තේ, උපන් දිනවල සිට අවුරුද්දක් පමණ වයස් වන තුරු ප්‍රමාණය වෙනස් කරමින් මසා ඇන්දවිය හැකි ළදරු ඇඳුමකි. ඒ සඳහා සිනිඳු, ලා තනි පැහැ හෝ මුද්‍රිත රෙදි පාවිච්චි කරන්න. කපු රෙදි නම් වඩාත් මැනවි. තනි පාට රෙදි වලින් ඇඳුම් පිළියෙල කළ විට, එම පාටේම තද පාටින් හෝ වෙනත් ගැළපෙන පාට කින්, කුඩා මලක්, සතෙක් හෝ විසිතුරු මැස්මක් යොදා අලංකාර කර ගන්න. පාට එකකට හෝ දෙකකට වැඩි ප්‍රමාණයක් පාවිච්චි නොකරන්න.


අඩි දෙකක පමණ හතරස් රෙද්දක් ගෙන (සටහන් බලන්න) කෝණාකාරව නමන්න. ඊට පසුව සටහන් වල පෙන්වා ඇති පරිදි කමිසය කපා ගන්න. පිටුපස වාටි දෙක, පහත වාටිය ද, රෙද්දෙන්ම නමා මසා ගන්න. කර හා අත්වල වාටි ද, රෙද්දෙන්ම නමා මැසිය හැකියි. නැති නම්, අත්, කර හා පහත වාටිය වෙනුවට බීක්කු මසන්න. උර හිස් නූල් දුව වා වාටි මැසීම කරන්න. ගැට ගැසීම සඳහා පිටු පසට කුඩා පටි කෑලි දෙකක් අල්ලන්න.

පපුවට කුඩා මල් ඉත්තක් හෝ වෙනත් විසිතුරු මැස්මක් යොදා හැඩ කර ගන්න. කමිසය ප්‍රමාණයෙන් ලොකු වන විට මල් ඉත්ත වෙනුවට, කුඩා සතකුගේ රූපයක් වෙනත් මෝස්තරයක් ඇප්ලික් කර ගත හැකිය. ඒවා සඳහා මෝස්තර කීපයක් ද මෙහි දක්වා ඇත.

නිමි.




◀ කිත් ඉර දිගේ රෙද්ද "අ", "ඇ" මතට එන ලෙසේ නමන්න.




◀ 1. උරහිස්
2. ඉදිරි පස
3. මැද නැමම
4. පිටුපස
5. ගල් වාටිය හෝ කෙලින් පැති.




◀ මසා නිම කළ ළදරු ඇඳුම.

අංක 4



අලංකාර කිරීම සඳහා මෝස්තර කිහිපයක්.